# ඔබ කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කිරීමට සූදානම් ද?

**01.** **පැහැදිලි හා හොඳින් සිතා බලා සකසාගත් ආයෝජන සැලැස්මක් ඔබ සතු විය යුතුය.**

- ★ ආයෝජන අරමුණු තීරණය කිරීම.
- ★ අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතය සහ අවදානම (දිගුකාලීන ආයෝජනය තුළින් කෙටිකාලීනව ඇතිවන උච්ඡාවචනයන් පිටු දැකිය හැකියි ) පිළිබඳ අදහසක් තිබීම.

**02.** **ඔබගේ අයෝජන සැලැස්ම සකසා ගැනීමේදී ඔබට වැදගත් වන අත්‍යවශ්‍ය කරුණු කිහිපයක් ඃ**

- ★ ආයෝජකයාගේ වයස - තරුණද/ මැදිවියේද/ විශ්‍රාම ගැනිමට ආසන්න ද යන වග) ඔබගේ වයස අනුව ඔබ දරන්නට කැමති අවදානම අනුව අපේක්ෂිත ප්‍රතිලාභය තීරණය කළ යුතුවේ
- ★ රැකියාවේ ස්වභාවය හා ආයෝජනය සඳහා ඔබ සතු ඉතුරුම්
- ★ දිගුකාලීනව ආයාජනයේ රැඳී සිටීමේ ශක්තිය් ඔබට දිගුකාලීනව යෙදිය හැකි මුදල් පමණක් කොටස් වෙළෙඳපොළේ ආයෝජනය කරන්න.
- ★ ද්‍රවශීලතාවය (ඉක්මනින් මුදල් බවට පත්කර ගැනීමේ හැකියාව)- ඔබේ කෙටිකාලීන අවශ්‍යතා සඳහා අවශ්‍ය සම්පත් කොටස් වෙළෙඳපොළේ ආයෝජනය නොකරන්න.

**03.** **විවිධ ආයෝජන මාර්ග හඳුනා ගැනීම සහ ඒවායේ සාපේක්ෂ ප්‍රතිලාභ සහ අවදානම පිළිබඳ අවබෝධයක් ලබා ගැනීම**

- දේපළ
- භාණ්ඩාගාර බිල්පත් සහ බැඳුම්කර
- ඒකකභාර
- ස්ථාවර තැන්පතු
- වාණිජ පත්‍රිකා
- කොටස් වෙළෙඳපොල
- විදේශ විනිමය

**ඔබේ සියළු සම්පත් එක ආයෝජන මාර්ගයක පමණක් යෙදවීමෙන් වලකින්න.**

**04.** **උපායශීලී ආයෝජන සැලැස්මකට අනුව ආයෝජනය කිරීම.**

**05.** **කටකථා සහ හඬා යෑමකට ලක් නොවී ස්වාධීන මූලාශ්‍රවල තොරතුරු සසඳා තමන් විසින්ම සිදුකරන විශ්ලේෂණයකින් පසුව පමණක් ආයෝජන තීරණ ගැනීම.**

**06.** **වෘත්තීයමය ආයෝජන උපදේශකයකුගේ / ප්‍රවීණයකුගේ සහාය ලබා ගැනීම (ලියාපදිංචි ආයෝජන උපදේශකයකුගේ වෘත්තීය මාර්ගෝපදේශනය මින් අදහස් වන අතර එයද මූලික මගපෙන්වීමක් සේ පමණක් සැලකිය යුතුය)**

**07.** **පහත සඳහන් කරුණු පිළිබඳව ද දළ වශයෙන් අවබෝධයක් තිබීම. ආයෝජනය කිරීමට අපේක්ෂිත සමාගමේ/ සමාගම්වල;**

1. ලාභදායීත්වය මුදල් ප්‍රවාහ සහ ඉපයුම් පිළිබඳව
2. සමාගමේ ඉදිරි සැළසුම් පිළිබඳව
3. කළමනාකාරීත්වය සහ නායකත්වය පිළිබඳව
4. සමාගම අයත් ක්ෂේත්‍රයේ වර්තමාන සහ අනාගත පුරෝකථනයන් පිළිබඳව
5. රටේ වර්තමාන සහ අනාගත ආර්ථික හා දේශපාලන තත්වයන් පිළිබඳව

**08.** **සෑම ආයෝජන අවස්ථාවකදීම තැරැව්කරු/ආයෝජන උපදේශක ලියාපදිංචි අයදැයි තහවුරු කරගන්න.**

ඔබ කුමන ආයෝජන මාර්ගයක් තෝරා ගනු ලැබුවද එය අවබෝධයෙන් යුතුව ගනු ලැබූ තීරණයක් වියයුතු වන අතර ඊට ඔබ සතු සහ සැපයෙන තොරතුරු උපකාරී වනු ඇත.පවතින කෙටිකාලීන තත්ත්වයන් හඬා යාම නුවණට හුරු නොවේ. ඔබට ප්‍රමාණවත් තරම් ප්‍රවීණත්වයක්, අත්දැකීම් සහ කාලයක් ඉහත පරිදි යෙදවීමට නොමැති වුවද තවදුරටත් කොටස් වෙළෙඳපොළේ ආයෝජනයට ඉඩ ප්‍රස්ථා ඇත. ඒ සඳහා ඔබට ඒකකභාර කළමනාකරුවකුගේ සහාය ලබාගනිමින් වඩාත් හොඳින් වෘත්තීයමය වශයෙන් විවිධාංගීකරණය කළ **"ඒකකභාරවල"** ආයෝජනයට යොමුවිය හැකියි.

***"ඔබේ ආයෝජන තීරණය සඳහා තොරතුරු මත කටයුතු කරන ඔබගේ බුද්ධියට ඉඩ දෙන්න"***

**මූල්‍ය සේවා විද්‍යායතනය**
අධ්‍යයන හා පුහුණු අංශය
**ශ්‍රී ලංකා සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාව**
28,29 වන මහළ , නැගෙනහිර කුළුණ
ලෝක වෙළෙඳ මධ්‍යස්ථානය
එච්ලන් චතුරශ්‍රය
කොළඹ 01.
වෙබ් අඩවිය - www.sec.gov.lk සහ www.fsalanka.edu,lk

**සටහන ඃ-**

***කොටස් වෙළෙඳපොළ ආයෝජනයන් පිළිබඳව ඔබට වැඩිදුර තොරතුරු අවශ්‍ය වේ නම් අපගේ දිපව්‍යාප්ත දැනුවත් කිරීමේ වැඩසටහන් වලට සහභාගීවීම, ආයෝජක පාඨමාලාව හැදෑරීම හෝ කොළඹ කොටස් වෙළෙඳපොළෙන් විමසීම් කළ හැකියි.***